{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

ශ්‍රේණිය - 13 | තෙවන වාර පරීක්ෂණය - 2025 | කාලය : පැය 3 යි 10

විෂයය : චිත්‍ර කලාව | පත්‍රය : I | ඇතුළත්වීමේ අංකය } ..............................

**පිළිතුරු පත්‍රය**

ලකුණු දීමේ පටිපාටිය

I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 3 | 11 | 2 | 21 | 1 | 31 | 4 |
| 2 | 5 | 12 | 3 | 22 | 1 | 32 | 5 |
| 3 | 4 | 13 | 2 | 23 | 3 | 33 | 4 |
| 4 | 1 | 14 | 5 | 24 | 2 | 34 | 5 |
| 5 | 2 | 15 | 5 | 25 | 4 | 35 | 2 |
| 6 | 2 | 16 | 4 | 26 | 5 | 36 | 4 |
| 7 | 5 | 17 | 5 | 27 | 3 | 37 | 2 |
| 8 | 4 | 18 | 3 | 28 | 4 | 38 | 5 |
| 9 | 2 | 19 | 1 | 29 | 2 | 39 | 3 |
| 10 | 5 | 20 | 3 | 30 | 2 | 40 | 1 |

{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }



| ශ්‍රේණිය - 13 | තෙවන වාර පරීක්ෂණය - 2025 | කාලය : පැය 3 වි 10 |
|---|---|---|
| විෂයය : චිත්‍ර කලාව | පත්‍රය : I | ඇතුළත්වීමේ අංකය |

**පිළිතුරු පත්‍රය**

**චිත්‍ර කලාව I පත්‍රය**

**II කොටස**

01. අනුරාධපුර යුගයට අයත් පැරණි පංච මහා විහාර වලින් එකක් වන ඉසුරුමුණු විහාරය දක්ඛින ථූපයත් නැගෙනහිර දොරටුවත් අතර තිසාවැව සමීපියේ පිහිටා ඇති අගනා කැටයම් සම්බන්ධයෙන් වැදගත් ස්ථානයකි.

I. මිනිසා සහ අශ්ව හිස, ජල ක්‍රීඩා කරන ඇතුන් (දියකෙළින ඇතුන්)

II. **ගුප්ත කලා ලක්ෂණ**

- චාම් බව හා සියුම් බව, ගැඹුරු භාව ප්‍රකාශනය, පිරිපුන් මටසිලිටි ශරීරාංග තාරුණ්‍ය ඉස්මතු කර දැක්වීම, ජීව ශක්තියෙන් යුක්තවීම, පිරිපුන් වටහුරු මුහුණ, වස්ත්‍ර තුළින් ඇඟ පසඟ මනාව මතු කර දැක්වීම.

උදා - පෙම් යුවල කැටයම, රජ පවුල් කැටයම

**පල්ලව කලා ලක්ෂණ**

- රිද්මයානුකූල ඉරියව්, දිගටි මුහුණු, දිගටි මානව හැඩතල ප්‍රතාපවත් බව දැක්වීම.

උදා - මිනිසා සහ අශ්ව හිස , ජල ක්‍රීඩාවේ කරන ඇතුන් (දියකෙළින ඇතුන්)

III. අ/පුර යුගයට අයත්ය, ශෛලමය කැටයම් වේ. දෙවන පැතිස් රජු විසින් කරවන ලදී.

**ඉසුරුමුණි කැටයම් සඳහා යොදාගත් තේමාවන්**

ආගමික තේමාවන්ගෙන් බැහැරව ලෞකිකත්වයට නැඹුරුතාවයක් ඇති තේමාවක් යොදාගැනීම.

- පෙම් යුවල කැටයම.
- රජ පවුල් කැටයම.
- මිනිසා සහ අශ්ව හිස කැටයම ජල ක්‍රීඩා කරන ඇතුන් දැක්වෙන කැටයම.
  (මෙම කැටයම් ඉන්දීය ගුප්ත හා පල්ලව කලා සම්ප්‍රදාය ගුරුකොට ගෙන ඇත).
- ඉසුරුමුණි පෙම්වල කැටයම ක්‍රි.ව. 4-5 සියවස් වලට අයත් වේ. තේමාව ඉසුරුමුණි පෙම් යුවලයි.
- මංජු ශ්‍රී - බෝසතාණන්ගේ වේශයක් බව.
- ශිව පාර්වතී බව, සෙබළුවෙකු හා ඔහුගේ පෙම්වතිය බව.
- කළුගල් මාධ්‍ය - හතරැස් ගල් පුවරුවක කැටයම් කර ඇත.
- නෙළීමේ ශිල්ප ක්‍රමයට අර්ධ උන්නතව කර ඇත.
- කලා ලක්ෂණ : ඉන්දීය ගුප්ත කලා ආභාෂය සහිතව ඇති අතර පිරිපුන් වටකුරු මුහුණ හා පිරිපුන් ශරීරාංග ප්‍රේමය පිළිබඳ භාවනාත්මක හැඟීම් ප්‍රකාශනය දක්නට ලැබේ.
- අලංකාර වස්ත්‍රාභරණයෙන් යුතුවීම, තලයට උචිත ලෙස රූප රචනය රිද්මයානුකූල ශරීරංග මටසිලිටි නිමාවකින් යුක්තය.

**මිනිසා සහ අශ්ව හිස**

- තේමාව : මිනිසා සහ අශ්ව හිස යනුවෙන් හඳුන්වයි.
- යුද සෙබළෙකු, සෙනෙවියෙකු, කපිල ඍෂිවරයා බව මත පවතී.

- සෙනරත් පරණවිතාන මහතාගේ මතය : අග්නි හා පර්ජන්‍ය බවයි. මිනිස් රුව - පර්ජන්‍ය අශ්ව හිස - අග්නි වන බවයි.

  පිරිමි ඉරියව්ව මහා රාජ ලීලාසන ලෙස ද සමස්ථ කැටයම් චාම් බවකින් යුක්ත වේ.
- මාධ්‍ය - ශෛලමය, පිහිටි ගලක අර්ධ උන්නතව නෙලා ඇත.
- රිද්මයානුකූල ඉරියව්, මටසිලිටි නිමාව, භාවාත්මක හැඟීම් ප්‍රකාශනය, දක්ෂ රූප රචනය, ප්‍රතාපවත් බව කැටයමේ විශේෂ ලක්ෂණ වේ.

**රජ පවුල කැටයමඃ**

- තේමාව : රජ පවුල නමින් හැඳින්වෙන ශෛලමය කැටයමයි.
- සෙනරත් පරණවිතාන මහතාගේ අදහස වන්නේ කැටයම මැද ඇති රුවෙන් දුටුගැමුණු රජුත්, මෙම රුවට දකුණු පස ඉදිරිය බලා දෑත් බැඳ හිඳ රුවෙන් සාලිය කුමරුත්, සාලිය කුමරුන් වම්පස සිටිනා රුවෙන් රජුගේ බිසවත් නිරූපණය වන බවයි. බිසව යැයි සැලකෙන රුවට වම්පසින් කුඩාවට දක්වා ඇති කාන්තා රූපය අශෝක මාලාගේ බව පවසයි.
- ශිල්ප ක්‍රමය අර්ධ උන්නත නෙළීමේ ක්‍රමයට නිමවා ඇත.
- කලා ලක්ෂණ - මෙය ගුප්ත කලාවේ ආභාෂය ගෙන තිබේ.
- මටසිලිටි නිමාව, රිද්මයානුකූල බව, විශිෂ්ට සංරචනය හා භාවාත්මක හැඟීම් ප්‍රකාශනය දක්නට ලැබේ.

**ජල ක්‍රීඩා කරන ඇතුන් :**

- මෙම කැටයමින් ජල ක්‍රීඩා කරන ඇත්තු දක්වා ඇත.
- පිහිටි ගලක (ස්වභාවික ගල් පර්වතයක) කැටයම් කර ඇත.
- ශිල්ප ක්‍රමය : අල්ප උන්නත ආකාරයෙන් කර ඇත.
- කලා ලක්ෂණ : පල්ලව කලා ලක්ෂණ ඇති බව කියැවේ.
- මහා බලිපුරම් හි ආකාශ ගංගාව රෝහණ කැටයමට සමානකම් දක්වයි.
- ඉතා සියුම් නිමාවකින් හා ඇතුන්ගේ තාත්වික ක්‍රියාශීලී ස්වභාවය චලනය රිද්මය මනාව සම්පින්ඩනය කරමින් කැටයම් කර ඇත.

02. ලංකා කලා සංගමයේ ශිල්පීන්

I. 1. ඒ.සී ජී.එස් අමරසේකර ශිල්පියා 2. ඩේවිඩ් ජෙන්ටර් ශිල්පියා 3. ජේ.ඩී.ඒ. පෙරේරා ශිල්පියා

II. **ශිල්පියා : සෝම බන්දු විද්‍යාපති**

- නූතන බෞද්ධ කලාව සම්බන්ධයෙන් ඉතා වැදගත් ශිල්පියෙකි.
- රේඛාව සහ වර්ණ කේන්ද්‍රීයව රූප ගොඩනැගීම, සුන්දර ලාලිත්‍යට මානව ඉරියව් විචිත්‍රවත්ව භාවිතා කර ඇත.
- සරණ මංගල්‍යය - බෙල්ලන්විල විහාරයේ ඇඳ ඇත.
- සිදුහත් කුමරුන්ගේ සහ යශෝධරාවන්ගේ විවාහ මංගල්‍යය මෙයට වස්තු විෂය විය.
- ස්වාධීන ශෛලයකින් යුක්තව මානව ඉරියව් ඇඳ ඇත.
- රේඛාව සහ වර්ණ කේන්ද්‍රීයව රූප ගොඩනගා ඇත. ලාලිත්‍යමය හා සුන්දර ස්වරූපයක් ගනී.
- ප්‍රධාන රූප යුවළ ශ්වේත වර්ණ (සුදු) වස්ත්‍රාභරණයෙන් සරසා ඇති අතර එම චරිත පාරිශුද්ධත්වයෙන් දක්වා ඇත.
- උණුසුම් වර්ණ මාලාවකින් පරිවාර රූප නිර්මාණය කර ඇත.
- සිදුහත් කුමරු යශෝධරාවන් අත මුදුවක් තබන අයුරු නිරූපිතය.
- නව යුවතිපතීන්ට ආශිර්වාද කරන අයුරු නිරූපණය කරයි.

**මාර පරාජය සිතුවම**

- බුදුන් මාරයින් පරාජයට පත් කරන ආකාරය නිරූපණය කරයි. බෙල්ලන්විල රජමහාවිහාරයේ ඇඳි සිතුමක් වන අතර සෝම බන්දු විද්‍යාපති ශිල්පියා විසින් නිර්මාණය කර ඇත.

- මාර පරාජය තේමාව නව්‍ය ආකාරයෙන් නිර්මාණය කර තිබේ.
- මාරයින් පරාජය කළ බව හැඟවෙන අයුරින් සිතුවම නිර්මාණය කර ඇත.
- බුදුන්ගේ රශ්මි මාලාව සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවා තරංගාකාරව දීර්ඝ කොට ඇඳ තිබේ.
- බුද්ධ තේජස හමුවේ පරාජයට පත් වූ මාරයින් වේදනාවෙන් තෙරපුණු ඉරියව්වලින් යුක්ත වේ. මනා සම්පිණ්ඩනයකින් යුක්තව බුදුන් හා බුදුන් හමුවට පැමිණි මාරයින් දක්වා තිබීම.
- ශිල්පියාටම ආවේණික වූ නව ශෛලියකින් රූප ඇඳී තිබීම.

III. 20 වන සියවසේ ශ්‍රී ලාංකේය බෞද්ධ විහාර චිත්‍ර ශිල්පීන්

- එම් සාර්ලිස් , සෝලියස් මැන්දිස්, සෝම්බන්ධු විද්‍යාපති, ජෝර්ජ කීට්.

**එම් සාර්ලිස්**

- මහමායා දේවියගේ සිහිනය.
- සරණ මංගල්‍යය.
- යුරෝපීය ස්වභාවික වාදී චිත්‍ර සම්ප්‍රදායේ ලක්ෂණ අනුගමනය කර ඇත.
- අඳුර එළිය දැක්වීම.
- ත්‍රිමාණ බව, පර්යාවලෝක මූලධර්ම භාවිතය.
- යුරෝපීය ක්‍රමවේද භාවිතා කළ ද සිතුවම් වල ගොඩනැගිලි සහ වස්ත්‍රාභරණ ඇඳ ඇත්තේ ඉන්දීය ආභාසයකිනි.
- සිදුහත් කුමරු හා මව් බිසව සිතුවම ද අපරදිග බටහිර ස්වභාවිකවාදී ලක්ෂණ ඇතුළත්ව ඇත.
- පුනරුද යුගයේ චිත්‍ර ශිල්පීන් අඳින ලද මරියතුමිය හා ජේසු බිළිඳා දැක්වෙන චිත්‍රවල ආභාශය ගෙන ඇඳ ඇත.

**සෝලියස් මෙන්දිස්**

- 20 වන සියවසේ ශ්‍රී ලාංකික නූතන බෞද්ධ සිතුවම් කලාව පෙරදිග කලා ලක්ෂණ මූලික කොටගෙන තමන්ටම ආවේණික වූ කලා සම්ප්‍රදායක් ඔස්සේ සිතුවම් ඇති ශිල්පියෙකි.
- මුල් කාලීනව යුරෝපීය ස්වභාවික වාදී ලක්ෂණ චිත්‍ර ඇඳි ආකාර පසුකාලීනව එම ශෛලයෙන් බැහැර විය.
- අජන්තා භාග් තිවංක පිළිමගෙය, සීගිරිය, වෙස්සගිරිය නන්දලාල්බෝස් ගේ නිර්මාණ හා පෙරදිග රීතීන් ගුරුකොට ගත් කලා නිර්මාණ හා මූලාශ්‍ර ආභාෂය.
- බුදුන් මහියංගණයට වැඩම කිරීම.
- ශ්‍රී පාද ලාංඡනය පිහිටුවීම.
- ශ්‍රී මහා බෝධිය වැඩම කරවීම ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ වැඩම කරවීම.
- අඳුර තුළින් ආලෝකය වඩාත් තීව්‍ර ලෙස මතු කර දැක්වීම හෙවත් ක්යාරස්කුරෝස් (බටහිර චිත්‍ර කලාවේ දැක්වේ)
- ඉන්දීය හා ශ්‍රී ලාංකේය සම්භාව්‍ය චිත්‍ර කලාව ගුරුකොට ගෙන ඇත.

03.

I. වාහල්කඩ, සඳකඩ පහණ, මුරගල, කොරවක්ගල, පියගැට පෙළ, පුන්කලස්

වාහල්කඩ නමැති වාස්තු විද්‍යාත්මක අංගය පිළිබඳ කරුණු අන්තර්ගත විය යුතුයි.

- දාගැබ ආශ්‍රිත කලා නිර්මාණයකි, “වාහල්කඩ” නමැති අංගය.
- මෙය අතීතයේදී ආදී මුඛ, ආයක, ආයික යන නම් වලින් හැඳින්විය.
- චෛත්‍යක අලංකාරය මෙන්ම ආරක්ෂාව සලසන ආධාරකයක් ලෙස නිර්මාණය කර ඇත.
- විශාල දාගැබ් හි ගර්භය හා සම්බන්ධව එහි පාමුල සතර දිශාවට මුහුණලා සිටින සේ නිමවා ඇත.
- වාහල්කඩ මුහුණත් (05) පහකින් සමන්විත වේ.
- වාහල්කඩ පහළ කොටස පාෂාණයෙන්ද ඉහළ කොටස ගඩොලින් ද නිමවා ඇත.
- වාහල්කඩ දෙකෙළවර විසිතුරු කැටයම් සහිත උස් වූ ගලින් කරන ලද ස්ථම්භ දෙකකි.

- එම ස්ථම්භ මත සතර දිශාවන් නියෝජනය වන පරිදි සත්ව රූප මූර්තිමත් කර ඇත.
    - උතුරු දිශාව - සිංහ
    - දකුණ දිශාව - ගව
    - නැගෙනහිර දිශාව - ඇත්
    - බටහිර දිශාව - අස්
- වාහල්කඩෙහි තිරස් අතට විහිදෙන බොරදම් තීරු ඇත. ඒවා වාමන රූ, හංස, ඇත් රූපවලින් කැටයම් කර ඇත.
- දැනට ශේෂව පවත්නා පැරණිම හා කලාත්මක වාහල්කඩ වන්නේ මිහින්තලේ කණ්ඨක චෛත්‍යයේ නැගෙනහිර වාහල්කඩයි.
- කණ්ඨක චෛත්‍යය නැගෙනහිර වාහල්කඩයෙහි දකුණු පස වාමන රූප පෙළ මධ්‍ය සණ දෙවි රූපයකි. එම රූපයට දෙපස වාමන රූ ගණ දේව රූපයට වඳින අයුරින් නිමවා ඇත.
- වාමන රුවට පහළින් හංස පේළියක්ද පහලින්ම හිස සහ ඉදිරි පාද දෙක සහිත ඇත් රූප පෙළක් නිර්මාණය කර ඇත.
- අභයගිරිය, ජේතවනාරාමය ආශ්‍රිතව ද වාහල්කඩ දැකිය හැකිය.

II. 1. සඳකඩපහණ

2. මුරගල

3. කොරවක්ගල

**සඳකඩ පහණ**

- ඉර හඳගල, ආරෝහ චක්‍රය, පද්මශීලා, චන්ද්‍රකාන්ත ආදී නම් වලින් හැඳින්වේ.
- පැරණි ගොඩනැගිලි ප්‍රවේශවල පියගැටපෙළ හා පාමුල මුලාරම්භක පඩිය වේ.
- ගල් පුවරුවකින් විකාශනය විය. (කැටයම් රහිත සිට කැටයම් සහිතව).
- අනුරාධපුර යුගයේ සිට පොළොන්නරු, මහනුවර යුග දක්වා ආකෘතිය වෙනස්වීම හා සැරසිලි කාලානුරූපව විවිධ වෙනස්වීම.
- ආකෘතිය අර්ධ කවාකාර සිට ත්‍රිකෝණාකාර ආකෘතින් දක්වා වෙන්වීම.
- පොළොන්නරුවේදී ගව රූපය ඉවත් වීම (හින්දු ආගමික බලපෑම්) මහනුවරදී සත්ව රූප සියල්ල ඉවත්වී මල් ලියකම් එක්වීම.
- මාධ්‍ය - කළුගල්
- ශිල්ප ක්‍රමය - නෙළීමේ ශිල්ප ක්‍රමයෙන් උන්නතව කර තිබීම.
- අනුරාධපුර බිසෝමාලිගය, රත්නප්‍රසාදය, ශ්‍රී මහා බෝධිය, රුවන්වැලි මහා සෑය යන ස්ථාන වලින් සඳකඩ පහණ හමුවී ඇත.
- කලාත්මක අතින් උසස්ම සඳකඩ පහණ බිසෝ මාලිගය සඳකඩ පහණ සෙනරත් පරණවිතාරන මහතා එම සඳකඩ පහණ පිළිබඳ නිර්මාණය විග්‍රහ කර මත පළ කර ඇත.
- මෙහි උපයෝගාත්මක අගය - පඩි පෙළ පාමුල පළමු පඩිය ලෙස භාවිතයට ගෙන ඇත.

**පොළොන්නරු යුගයේ සඳකඩ පහණ**

- විවිධ වෙනස්කම් වලට භාජනය වී ඇත.
- බාහිර හැඩය අර්ධ වෘත්තාකාරය.
- හින්දු ආගමික බලපෑම් මත ගවයා ඉවත් කිරීම.
- වෙන් වෙන්ව තීරුවල සතුන් දැක්වීම.
- කලාත්මක සඳකඩ පහණ පොළොන්නරු වටදාගේ සඳකඩ පහණ වේ.
- තවද කිරිවෙහෙර, බද්ධසීමා මාලකය සඳකඩ පහන් ඇත.

**මහනුවර යුගයේ සඳකඩ පහණ**

- ආකෘතිය හා කැටයම් පූර්ණ වෙනසකට භාජනය විය.
- ත්‍රිකෝණාකාර ආකෘතිය හා පූර්ණ නෙළුමක් දක්නට ලැබේ.
- සත්ව රූප සියල්ල ඉවත්වී මල් හා ලියකම් කැටයම් කර ඇත.
- තීරු ඉවත්ව ඇත.
- පියගැට පෙලට ආබද්ධ වන ස්ථානයේ අඩි එකහමාරක් පමණ පළල් තීරුවකි.
- මධ්‍යයේ ඇති පද්මය වටා ලියවැල් මෝස්තර ගමන් කරන අයුරින් දක්වා ඇත.
- අර්ථාන්විත භාවය අඩුය. කලාත්මක සඳකඩ පහණ මහනුවර දළදා මාලිගයේ ඇති සඳකඩපහන හා හගුරන් කෙත පොත්ගුල් විහාරයේ සඳකඩ පහණ බව පෙන්වා දිය හැකිය.

**මුරගල**

- නාගශිලා/ අරක්ගල/ආරක්‍ෂාගල යන නම් වලින් හැඳින්වෙයි.
- පඩිපෙළ දෙපස කොරවක්ගල ඉදිරියෙන් සිරස්ව සිටුවා ඇත.
- ආරම්භය හා විකාශනය - දිගටි හතරැස් ගල් පුවරු කැටයම් රහිතව තිබුණි.
- මුරගලෙහි ඉහළ වක්‍රාකාර විය.
- පුන්කළස, බහිරව රූප, නාග රූප (පෙන පහ සහ පෙන හත සහිතව) නා රජ සහිතව මුරගල නිර්මාණය කර ඇත.
- පුන්කළස සහිත මුරගල් - කුට්ටම් පොකුණ / ඉසුරුමුණි විහාරය
- නාග රූප සහිත මුරගල් - අවුකන විහාරය/ මැදිරිගිරිය වටදාගේ
- බහිරව රූප සහිත මුරගල් - ඉසුරුමුණි /අභයගිරි විහාරය /පළමුවන විජයබා රජ වාසල
- නා රජරුව සහිත මුරගල් - (රත්නප්‍රසාදය)
- යුගල රූප සහිත මුරගල් - මහසෙන් මාළිගයේ නැගෙනහිර දිශාවේ මුරගල (දිසාපාලක හා භාර්යාව දැක්වේ) රුහුණේ දෙමටමල් විහාරය.

**කොරවක් ගල**

- කරවක්ගල, කරඅත්ගල කයියෝරුගල යනුවෙන් හැඳින්වේ.
- ආරම්භය කැටයම් රහිත අත් වැටකි.
- පඩිපෙළ ස්ථාවර කර ගැනීමට.
- අනුරාධපුර - ගලින්ද පොළොන්නරුව හුණු බදාම හා ගඩොල් වලින්ද කොරවක් ගල නිර්මාණය කර ඇත.
- අත් වැටට පහළ ඇතුළත පිටත කැටයම් කරන ලදී.
- අභයගිරියේ හමු වූ කොරවක්ගල පුන්කලස් කැටයම් කර ඇත.
- පොළොන්නරු වටදාගෙය - සිංහ රූප යෙදූ කොරවක් ගල් දක්නට ලැබේ.
- ඉසුරුමුණි විහාරයේ කොරවක්ගල - ඇත් රූප යොදූ කොරවක්ගල් දක්නට ලැබේ.
- පොලොන්නරුව ලංකා තිලක පිළිම ගෙයි දොරටුව අබියස - දිසා පාල රූව, බිරිඳ, වාමන හා සතුන්
- දඹදෙණිය යුගය - ඇත් රූප යෙදූ කොරවක්ගල ගම්පොළ, ලංකාතිලකය, ගඩලාදෙණිය
- ගම්පොළ, ලංකාතිලකය, ගඩලාදෙණිය - ගජසිංහ රූව යෙදූ කොරවක්ගල
- මහනුවර යුගය - ඇත්සොඬ සහිත ලියවැල්

**පියගැට පෙළ**

- ගල් මාධ්‍යයෙන් කැටයම් රහිත හා සහිත වර්ග දෙකකි.
- උපයෝග්‍යතාව - පර්වතයක් හෝ කන්දක් (ඉහළ පිහිටි පූජනීය ස්ථානයකට නැගීමට යොදා ගෙන ඇත.)
- කැටයම් රහිත පිය ගැට පෙළ - පර්වතයක් හෝ කන්දක් නැගීමට යොදා ගෙන ඇත. (මිහින්තලය පුදබිමට යාමට ඇති පියගැටපෙළ)
- කැටයම් සහිත පිය ගැටපෙළ පූජනීය ස්ථාන හා ඓතිහාසික වෙනත් ගොඩනැගිලි සඳහා යොදාගෙන ඇත.

- සෝපාන පන්තියක සිරස් මුහුණතේ කැටයම් යොදා ඇත.
- පියගැටපෙළ පඩි අටකින් සමන්විත නම් ආර්ය අෂ්ටාංගික මාර්ගය බව (සෙනරත් පරණවිතාන මහතාගේ මතයක් පවතී)

**අනුරාධපුර යුගය - මහසෙන් මාලිගය**

- පියගැටපෙල
- මහසෙන් මාලිගය පියගැටපෙළ වජ්‍ර හා වාමන රූප වලින් කැටයම් කර ඇත.
- මහනුවර යුගය - මහනුවර විෂ්ණු දේවාලය පියගැටපෙළ අලංකාර ලියවැල් කැටයම් කර ඇත.

**පුන්කලස**

- පිරුණු කලස පූර්ණ ඝටය කළුගල් මාධ්‍ය
- උපයෝග්‍යතාව - පූජනීය ස්ථාන හා මඟුල් පොකුණු ආශ්‍රිත දක්නට ලැබේ.
- සෞභාග්‍ය, ආඪ්‍ය බව වාසනාව සංකේතවත් කරයි.
- අනුරාධපුර යුගයේ - මුරගල්වල සහ වාහල්කඩ කුළුණු කැටයම් වල පුන්කලස් කැටයම් අර්ධ උන්නතව නෙලා ඇත.
- පූර්ණ උන්නතව කළ පුන්කලස් කුට්ටම් පොකුණෙහි දක්නට ලැබේ.

**"ආ" කොටස**

(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

04.

I. මෝගල් චිත්‍ර

- බාබූර් අධිරාජ්‍යා උද්‍යාන නිරීක්ෂණය
- අක්බාර් රජුගේ යුධ දර්ශනය

II.

- ඉස්ලාම් භක්තික මෝගල්වරු හා පර්සියානුවන් අතර පැවති සබඳතා.
- ඉස්ලාම් ආගම සම්බන්ධ කිසිම සංකල්පයක් චිත්‍ර ආකාරයෙන් දැක්වීමට මෝගල්වරු කැමැත්ත දක්වා නැත.
- ආගමික දර්ශනයෙන් බැහැරව ලෞකික තේමාවන් යටතේ චිත්‍ර නිර්මාණය කිරීම මෝගල්වරු ආරම්භ කරන ලදී.
- පර්සියන් ආභාසය මත ආරම්භ වූ මෝගල් චිත්‍ර කලා සම්ප්‍රදාය ඉන්දීය ශිල්පීන් අතට පත්වීමෙන් දෙස් විදෙස් සංකලනය මුසු වූ චිත්‍ර කලාවක් විය.
- ඒ අනුව මෝගල් චිත්‍ර සම්ප්‍රදාය ඉන්දු පර්සියානු චිත්‍ර සම්ප්‍රදාය ලෙසද හඳුන්වනු ලැබීය.
- නිදසුන් ලෙස හුමායන් කළ ලියන ලද "ඉ - අමීර් හම්සානාම" ග්‍රන්ථය සඳහා අඳින ලද චිත්‍ර "අක්බර් නාම" යන චිත්‍ර විශේෂය පෙන්වා දිය හැකිය.
- පර්සීන් ආභාෂය - ද්විමාන ස්වරූපයක් ගත් අතර භාරතීය ආභාෂය හා මුසුවීමක් සමඟ ත්‍රිමාණ ලක්ෂණ හා සංකීර්ණ බවක් පිළිබිඹු කරයි.
- මානව රූප හා තේමාවට උචිත පරිසරය දැක්වීමේදී සියුම් හා විස්තරාත්මක බවකින් යුතුව දක්වා ඇත.
- භාරතය තුළ මුස්ලිම් ආධිපත්‍යයේ ව්‍යාප්තිය කලා ශිල්ප කෙරෙහි බලපා ඇත.

III.

- මෝගල් චිත්‍ර කලා සම්ප්‍රදාය පර්සියෙන් ආදර්ශ මත භාරතයේ බිහි වූ කලාවකි.
- ඉස්ලාම් භක්තික මෝගල්වරුන් හා පර්සියානුවන් අතර පැවැති සමීප සබඳතා මෝගල් කලාවේ ප්‍රවර්ධනයට බලපා ඇත.

**මෝගල් චිත්‍රවල ලක්ෂණ**

- විස්තරාත්මක බවින් යුක්ත වීම, සැරසිලිමය ස්වභාවයක් දක්නට ලැබේ.
- දීප්තිමත් වර්ණ භාවිතය. සිතුවම් ප්‍රමාණයෙන් කුඩා වීම. මෝගල් චිත්‍ර සඳහා වස්තු විෂයඃ රාජ සභා දර්ශන

- දඩයම් දර්ශන
- විවිධ පක්ෂීන්, සත්ව රූප
- රජුගේ දෛනික ජීවිතය හා සම්බන්ධ දර්ශන
- පැළෑටි, මල් වර්ග

**රාජ්පුට් චිත්‍රවල ලක්ෂණ**

- ද්විමාන ශෛලයක් අනුගමනය කිරීම
- වර්ණ භාවිතය පැතලි බවක් ගැනීම
- සියුම් රේඛාකරණය
- විචිත්‍ර වර්ණ භාවිතය
- මෝගල් චිත්‍ර පදනම් කරගෙන ප්‍රාදේශීය චිත්‍ර කලාවක් ලෙස රාජ්පුට් චිත්‍ර කලාවද බිහි වූ බව පෙන්වා දිය හැක.
- "රාජ පුටානා" ප්‍රදේශය ආශ්‍රිතව ව්‍යාප්ත විය.
- හින්දු භක්තිකයන් තුළින් බිහිවූ කලාවකි.

**රාජ්පුට් චිත්‍ර සඳහා වස්තු විෂය වූයේ**

- ගීත ගෝවින්දය
- රාමායනය
- නලධමයන්ති
- පරමාෂා
- රසික ප්‍රියය
- චෞර පංචසිකය
- මහභාරතය
- මර්තන්ඩෙයි පුරානය
- රාජ් පුට් ශිල්පීන් අතර බොහෝ ජනප්‍රිය තේමාව වූයේ ගීත ගෝවින්දයේ එන රාධා ක්‍රිෂ්ණාගේ ප්‍රේම කතාවයි.
- රාධා හමුවීමට පැමිණි ක්‍රිෂ්ණා (රසික ප්‍රියය ග්‍රන්ථයේ සඳහන් වේ)
- බිල්හානා හා චම්පාවතිනිය චෞර පංචසිකය ග්‍රන්ථයේ දැක්වෙන චිත්‍ර පෙළ.
- හින්දු සාහිත්‍ය කෘතිය ඇසුරින් බිහි වූ චිත්‍ර විශාල සංඛ්‍යාවක් දක්නට ලැබේ.

**කොටි දඩයම**

- ගෝපිකාවන් සමග සිටින ක්‍රිෂ්ණා
- දිය නාන ගෝපි ලඳුන්ගේ සළුපිලි සැඟවීම.
- ශිව නර්තනය.
- ක්‍රිෂ්ණා කාලිය නමැති සර්පයා දමනය කිරීම.

**මෝගල් රාජ්පුත් චිත්‍රවල දැකිය හැකි පොදු කලා ලක්ෂණ**

- සිතුවම් ප්‍රමාණයෙන් කුඩා වීම ද්විමාන ශෛලියක් අනුගමනය කිරීම.
- විචිත්‍ර වර්ණ යොදා ගැනීම හා රන් පැහැය යොදා ගැනීම.
- නිරූපිත හැඩතල විස්තරාත්මකව දැක්වීම.
- වර්ණ භාවිතයේදී පැතලි බව දක්නට ලැබීම.
- ජන කලා බව දක්නට ලැබීම, සියුම් රේඛාකරණය හා මනා නිමාවකින් යුක්ත වීම.

05.

I. සාරානාත් බුද්ධ ප්‍රතිමාව

- මතුරා හිටි බුද්ධ ප්‍රතිමාව (ජමල්පූර් හිටි පිළිමය)

II.

- ක්‍රි.ව.320 දී චන්ද්‍ර ගුප්ත නම් රජු පාටලීපුත්‍රය හෙවත් වත්මන් පැට්නා නගරය අගනුවර කොටගෙන රජවීමෙන් ගුප්ත රාජ්‍ය ආරම්භ විය.
- 4 සිට 7 දක්වා සියවස් අතර ක්‍රමිකව දියුණුවූ කලා සම්ප්‍රදායක් ලෙස ගුප්ත කලා සම්ප්‍රදාය පෙන්වා දිය හැකිය. සංස්කෘතික අතින් ඉමහත් ප්‍රබෝධයක් ඇතිවන ගුප්ත යුගය ආගමික, සාහිත්‍ය හා කලා ශිල්ප මෙන්ම විද්‍යා ශාස්ත්‍ර ආදිය අංශවල උසස් දියුණුවක් ඇති විය.
- ගුප්ත යුගය උසස් තත්ත්වයට පත්වීමට හේතු සාධක ගණනාවක් මුල් වූ අතර උසස් තත්ත්වයට පත් වූ කලා මධ්‍යස්ථාන රාශියක් තිබූ අතර බුදුපිළිම නිර්මාණ බිහිවීමට මථුරා හා සාරණාත් වශයෙන් ප්‍රධාන කලා මධ්‍යස්ථාන පැවතුනි.
- ගුප්ත කලාව යනු නවතම කලා සම්ප්‍රදායක බිහිවීමක් නොවූ අතර පැවති කලා සම්ප්‍රදාය උසස් තත්ත්වයට පත් වීමයි.
- මථුරා කලාවේ වර්ධනයේ අවස්ථාවක් බව කිව හැකිය.
- ගුප්ත රාජ්‍ය පාලන තන්ත්‍රය විශිෂ්ට නිර්මාණ බිහිකිරීමට බෙහෙවින් බලපා ඇත.

**ඒ අනුව**

- සාරාණාත් බුදුපිළිමය
- මථුරා හිටි බුදුපිළිමය පෙන්වා දිය හැකිය.

III.

- ගුප්ත යුගයට අයත් සුවිශේෂී බුදුපිළිම දෙකක් ලෙස සාරානාත් පිළිමයක් මථුරා හිටි බුදු පිළිමයත් (ජමල්පූර් හිටි පිළිමය) හැඳින්විය හැකිය.

**ගුප්ත නිර්මාණවල සුවිශේෂී ලක්ෂණ :**

- උපශාන්ත බව චාම්බව හා සියුම් බව.
- ඇඟට ඇලුනු ස්වභාවයෙන් වස්ත්‍ර තුළින් ඇඟ පසඟ මතු කර දැක්වීම.
- ගැඹුරු භාව ප්‍රකාශනය විදේශීය ලක්ෂණවලින් තොර දේශීය ලක්ෂණ දැක්වීම.
- පිරිපුන් මටසිලිටි ශරීරාංග තාරුණ්‍ය දැක්වීම.
- බුදුන් පිළිම වල කුණ්ඩලාකාර හිසගේ හා උෂ්ණීෂය දැක්වීම.

**සාරානාත් බුදුපිළිමය**

- ගුප්ත සම්ප්‍රදායේ සාරානාත් ගුරුකුලෙන් බිහි වූ සුවිශේෂී අග්‍ර ගණ්‍ය නිර්මාණයක් වේ.
- චූනාර් පාෂාණයෙන්  නිමවා ඇත.
- ධම්මචක්ක මුද්‍රාවෙන් යුත් මෙය පද්මාසන ක්‍රමයෙන් යුක්තවේ.
- මෙහි වස්තු විෂය වන්නේ බුදුන් වහන්සේ පස්වග මහණුන්ට දම්සක් පැවතුන් සූත්‍රය දේශනා කිරීමයි.
- මුහුණු ඕවලාකාරය, කුණ්ඩලාකාර හිසකේ, හා උෂ්ණීෂය දක්වා ඇත.
- බුදුන් වහන්සේගේ මහා කරුණාව දයාව හා සොම්නස දැක්වීම අසමසම පෞරුෂය මතුකර ඇත.
- දෙවුර වැසෙන සේ පොරවන ලද චීවරය රැළි රහිතව ඉතා සියුම්ව සිරුර විනිවිද පෙනෙනා ස්වරූපයෙන් දැක්වීම.

**මථුරා හිටි පිළිමය**

- ගුප්ත යුගයට අයත් මථුරා කලා සම්ප්‍රදායට අයත් බව සැලකේ. රතු වැලි ගලින් නිමවා ඇත. සුන්දර, චමත්කාර ජනකය, කඩවසම් දේහ ලක්ෂණ නිරූපණය කරයි.
- කුණ්ඩලාකාර හිසයේ උෂ්ණීය දක්වා ඇත.
- අඩවන් දෙනෙත්, මඳ සිනහව, ලඹ සවන් ආදිය මඟින් බුදුරජාණන් වහන්සේගේ ආධ්‍යාත්මික ගුණ මතුකෙරේ.
- නෙලුම් පෙති ලියවැල් ආදියෙන් ඉතා අලංකාර සියුම් කැටයම් සහිත ප්‍රභා මණ්ඩලයකි.

### "ඉ" කොටස

(යුරෝපය)

06.

I.

- සැල්වර්දෝර් ඩාලි

  01. නොමියෙන මතකය (The persistance of Memory )

  02. නින්ද (sleep)

- ෆ්‍රීඩා කාලෝ - 01. ස්වයං අලේඛ්‍ය සමඟ කටු මාලය (Self Portait With Nechlace Of Throns) ෆ්‍රීඩා දෙදෙනා (Two Fridas)

II.

- 20 වැනි සියවස ප්‍රථම භාගයේදී පැන නැගුණු වැදගත් කලා ව්‍යාපාරයකි.
- මෙම ප්‍රවණතාවට වස්තු විෂය වූයේ දෙවන ලෝක මහා යුද්ධයේදී ඇති වූ අප්‍රසන්න අත්දැකීම්ය.
- අතාර්කිකත්වය අභව්‍ය හා ආත්ම විවරණය මෙම ප්‍රවණතාවේ මූලික තේමා වේ.
- අරුම සහ ප්‍රහේලිකාමය රූපක ගොඩනැගීම දැකිය හැක.
- බාහිර ලොවට වඩා සිත අභ්‍යන්තරයේ මනෝභාවයන්වල වැදගත්කම පෙන්වා දෙන ලදී.

III. **සැල්වදෝර් ඩාලි (1904 - 1984)**

- ස්පාඤ්ඤයේ උපත ලැබූ අධිතාත්විකවාදී ශිල්පියෙකි.
- මොහුගේ සිතුවම් තුළ දක්නට ලැබෙන්නේ සිත අභ්‍යන්තරයේ මනෝභාවයන් වල වැදගත්කමයි.
- උප විඥානගත ආවේශයන්ගෙන් පැන නැගුණු තේමා මොහුගේ සිතුවම් තුළ දක්නට ලැබේ.
- සිග්මන් ෆොයිඩ්ගේ මනෝ විද්‍යාත්මක සංකල්ප ඩාල්ගේ සිතුම් සඳහා බලපා ඇත.
- අද්භූත බව, අතාර්කිකත්වය, ස්වප්නමය ස්වභාවය, අතිශයෝක්තිය සහ සංකේතාත්මක බව යන මූලික ලක්ෂණ දක්නට ලැබේ.

**නොමියෙන මතකය (The persistant Memory)**

- සංකේතාත්මක වස්තු රැසකින් සමන්විත වේ.
- මෙය තෙල්සායම් මාධ්‍යයෙන් ඇඳ ඇත.
- වැගිරෙන ඔරලෝසු, කුහුඹින් මෙහි සංකේතාත්මක සත්තු වේ.
- චිත්‍රය මධ්‍යය දිගු නාසයක් සහිත හිසකි. එයින් නිදාගෙන සිටින සිහින දකින අයෙකු සිහිගන්වයි.
- මෙම හිස සියුම්ව නිරීක්ෂණය කිරීමේදී විවිධ කෘමීන්ගේ ආකෘතිවලට සමාන හැඩතල ඇඳ ඇත.
- ඇහි පිහාටු, දිගු ලොම් සහිත දළඹුවෙකු ලෙස හා නාසය තුළින් මතුවන ගොළුබෙල්ලෙකුගේ හැඩයක් දක්වයි.
- කාලය, අවකාශය, ස්වභාවයන් යන ත්‍රිත්වය සම්බන්ධ කළ දෘශ්‍යමය නිර්මාණයකි.

**නින්ද (Sleep)**

- මෙහි නිදිගත් හිසක් ආධාරක මත තබා ඇති අතර මෙහි තාත්වික නොවන භූමි දර්ශනයකි.
- අධිතාත්විකවාදීන්ගේ විශ්වාසයක් වන නින්ද සමඟ අවිඥානය මෙහි විෂය වී ඇත.
- ක්ෂිතිජයෙන් ඔබ්බට ගිය අරුම පුදුම කඳු සහිත භූමි පරිසරයක් මෙහි දක්වා ඇත.
- ආධාරක මත රඳවා ඇති මුහුණ කඩා හැලෙන ස්වරූපයකින් දක්වා ඇත.
- ත්‍රිමාණ බව හා පර්යාවලෝක ලක්ෂණ සමඟ ස්වභාවිකත්වයෙන් ඈත් වූ අතර අධිතාත්වික ස්වරූපයක් අනුව රූපක තේමා කොට ගෙන ඇත.

**ෆ්‍රීඩා කාලෝ (Frida khala 1907 - 1954 )**

- ජීවන අත්දැකීම් හා හැඟීම් වස්තු විෂය කරගෙන ඇත. පරිකල්පනය හා ගුප්ත ස්වභාවය දක්නට ලැබේ.

- ස්වයං අධ්‍යයනයෙන් නිර්මාණකරණයට පිවිස ඇත.
- මැයගේ කලා කෘති සඳහා මැක්සියානු ජන කලාවත් හා දියෝගා රිවේරාගේ කලා ආභාෂය ලැබ ඇත.
- අවකාශය පිරී ඇත, සංකේතාත්මක රූපක හා ත්‍රිමාන බව පර්යාව ලෝකය දක්නට ලැබේ.

**ස්වයං ආලේඛ්‍ය සමඟ කටුමාලය (Self Portait with Nechlace Of Throns)**

- තෙල් සායමින් කැන්වසය මත ස්ව ආලේඛ්‍ය කෘතිය නිමවා ඇත.
- මෙම රූපයේ ගෙල වටා දිවෙන කටුමාලය උඩුකය වටා විහිදී ඇත.එයා මැද කුඩා කුරුල්ලෙක් චිත්‍රණය කර ඇත. (Humming bird )
- උරහිස දෙපස වඳුරෙක් හා බළලෙක් සිටි.
- සතුන් මගින් පුද්ගලික ජීවිතයේ හැඟීම් සංකේතාත්මකව නිරූපණය කරයි.
- පැහැදිලි වර්ණ භාවිතයේ ත්‍රිමාන බව, පර්යාවලෝකය මෙන්ම විස්තරාත්මක ලක්ෂණ හොඳින් මතු කර දක්වා ඇත.

**ෆ්‍රීඩා දෙදෙනා (Two fridas)**

- ෆ්‍රීඩාගේ අලේඛ්‍ය දෙයාකාරයකින් ඉදිරිපත් කර ඇත.
- එක් පසෙක හංගේරියානු ජර්මන් සම්බන්ධයක් සහිත ෆ්‍රීඩා ද අනෙක් පස මැක්සිකානු උරුමය සහිත ෆ්‍රීඩා දැක්වේ. මෙම ද්විත්ව රූපවල හදවත් විවෘතව දක්වා ඇත.
- ත්‍රිමාණ බව, වර්ණ බව භාවිතය මෙන්ම විස්තරාත්මක රූප නිරූපණය හා සංකේතාත්මක බව කැපී පෙනෙන ලක්ෂණ වේ.

07.

I. **රෝම සිතුවම් :-**

- ඩයෝනීසස් දෙවියන් පිදීම සම්බන්ධ සිතුවම "ගැහැණියකට දඬුවම් කරන අවස්ථාව"
- "උඩුකය දැක්වෙන මමී අලේඛ්‍ය සිතුවම"

**රෝම මූර්ති :-**

- ඕගස්ටස් සීසර් (ශීර්ෂ මූර්තිය)
- ජුලියස් සීසර් (ශීර්ෂ මූර්තිය)
- කැරකැල්ලා (උඩුකය මූර්තිය)
- වෙස් පාසියන් (ශීර්ෂ මූර්තිය)
- පොම්පේ (ශීර්ෂ මූර්තිය)
- නොහඳුනන රෝමානුවා (ශීර්ෂ මූර්තිය)

II. **ට්‍රැජන් / ට්‍රාජන් කුලුන**

- ක්‍රි.ව. 107 - 113 කාලයේ දී ඉදිකරන්නට ඇතැයි සැලකේ.
- මෙම වාස්තු විද්‍යාත්මක කුළුණද යුද්ධ විජයග්‍රහණ අනුස්මරණය සඳහා ගොඩනගා ඇත.
- ට්‍රැජන් අධිරාජ්‍යයාගේ ඩේසියානු (Decian) යුද්ධ ජයග්‍රහණය සැමරීම සඳහා මෙය ඉදිකර ඇත.
- මෙහි සමස්ථ උස අඩි 125 ක් වන අතර, කුලුනු බද උස අඩි 98 කි.
- කැටයම් රූපාවලියකි.
- ඩේසියන්වරු සමග කළ සටන මෙහි කැටයම් කර ඇත.
- කුලුන අභ්‍යන්තරයේ සිට ඉහළට නැගීමට සර්පිලා ආකාර පඩිපෙළකි.
- මෙම කුලුන ඉහළ කොටසේ ට්‍රැජන් අධිරාජ්‍යා දක්වා ඇත.
- තලය පිරී යන සේ ඉතා සියුම් ලෙස කැටයම් කර ඇත.
- මෙහි පාදම අධිරාජ්‍යාගේ භෂ්මාවශේෂ තැන්පත් කිරීම සඳහා නිර්මාණය වේ.

III.

- මුල් කාලීන ග්‍රික මූර්තිවල මුහුණු භාව විරහිත ස්වරූපයෙන් නිර්මාණය කර ඇත.
- පසුකාලීනව මද සිනහවක් මුහුණට එක්කොට ඇත.
- පරමාදර්ශී කාය විලාශය දක්වයි.
- විස්තරාත්මකව  මානව ශරීරයය දක්වා තිබීම.
- මූර්ති සඳහා ලෝකඩ හා කිරිගරුඬ පාෂාණය මාධ්‍ය ලෙස භාවිතා කිරීම.
- මානව රුවක් මගින් දේවත්වය ඉස්මතු කිරීමට ගත් උත්සාහය පෙන්වා දිය හැකිය.

**නිදසුන් වශයෙන්,**

- දිව්‍යාංගනාවන් තිදෙනා
- ඇතිනා දේවඟන
- නිකා දෙවගන
- හර්මිස් සහ ඩයොනිසස්

**දිව්‍යාංගනාවන් තිදෙනා (ELGIN MARBLES)**

- ක්‍රි.පූ. 5 වන සියවසට අයත් වේ.
- පීඩියස් විසින් නිර්මාණය කර ඇත .
- කිරිගරුඬ මාධ්‍ය භාවිතයෙන් කර ඇත.
- දිව්‍යාංගනාව සේ සැලකෙන මෙම කතුන්ගේ ඉරියව් මන බඳින අයුරින් නිමවා ඇත.
- මෙම මූර්තියේ අත්, හිස් සුන් වී ඇති නමුත් දිව්‍යමය ස්වරූපයක් ආරෝපණය කරමින් දක්වා තිබේ.

**ඇතීනා දෙවඟන (GODDESS  ATMENA)**

- ග්‍රීක සම්භාව යුගයේදී නිමවා ඇත.
- මූර්ති ශිල්පී පීඩියස් විසින් නිර්මාණය කර ඇත.
- කිරි ගරුඬ මාධ්‍ය භාවිතා කර ඇත.
- පාතිනන් දෙවොලෙන් සොයා ගන්නා ලදී.
- ග්‍රීක පුරාවෘත්තයට අනුව ඇතිනා දෙවඟන ක්‍රීඩාවට අධිපති සිවුස් දෙවියන්ගේ එකම දියණිය වේ.
- කර්මාන්ත, කලාව ප්‍රබන්ධ සාහිත්‍ය, ප්‍රඥාවට හා යුද්ධයට අධිපති දෙවඟන ලෙස සලකනු ලබයි.
- මෙම පිළිරුව ඉතාලියේ නේපල්ස් ජාතික පුරාවිද්‍යා කෞතුකාගාරයේ දක්නට ඇත.

**නීකා දෙවඟන (NIKE OF SAMOTHRACE)**

- නීකා දෙවඟන හෙවත් ජයග්‍රහණයේ දෙවඟන ලෙස හැඳින්වේ.
- ක්‍රි.පූ.200 දී නිර්මිත වූ ග්‍රීක හෙළ නිර්ටික යුගයට අයත් බව සැලකේ.
- කාන්තා මූර්ති අතර ක්‍රියාකාරීත්වය, කඩිසර ඉරියව්වකින් සමන්විත වේ.
- සමෝතාකි දූපතෙන් හමුවී ඇත.
- එබැවින් සමෝතරේස්හි නීකා දෙවඟන ලෙසද හඳුන්වයි. දැනට පැරිස් ලුවර් කෞතුකාගාරයේ තැන්පත් කොට ඇත.

**හර්මින් සහ ඩයෝනීසස්**

- ප්රැක්සිටේල්ස් විසින් නිර්මාණය කරන ලදී.
- ක්‍රි.පූ.4 වන සියවසට අයත් වේ. උස අඩි 7 ක් පමණ වේ.
- මෙය ඔලිම්පියාවෙහි හේරෝ දෙව් මැදුරෙන් සොයාගන්නා ලදී.
- පරමාදර්ශී රූපකායෙන් නිමවා ඇත.
- පුරුෂ රූප දිව්‍ය හා වීර චරිත නිරුවත්ව නිර්මාණය වූ බැවින් මෙම මූර්තියද නිරුවතින් දක්වා ඇත.
- ඩයෝනීසස් බිළිඳා වඩාගෙන සිටින තරුණ හර්මිස්ගේ තාරුණ්‍ය ශක්තියත් බිළිඳාගේ සුරතල් මොළකැටි ස්වභාවය දැක්වීමට ගත් උත්සාහය වැදගත් වේ.

- තිවංක ඉරියව්වෙන් දක්වා ඇත.
- තාත්වික අයුරින් නිමවා ඇති අතර ඉතා උසස් නිර්මාණයක් ලෙස හැඳින්වේ.
- රෝම මූර්ති මනුෂ්‍යත්වය හා ස්වභාවිකත්වය පදනම් කොටගෙන නිර්මාණය කර ඇත.
- එක් එක් පුද්ගලයන්ගේ පෞද්ගලික හා අභ්‍යන්තර ගති ලක්ෂණ තාත්වික අයුරින් නිර්මාණය කර ඇත.
- මානව සිරුර හා මානව හැඟීම් නිවැරදිව දක්වා ඇත.
- මාංශ පේශී වල පවතින තාත්වික බව හා සියුම් තැන් ඉතා දක්ෂ ලෙස මූර්තිමත් කර ඇත.
- කිරිගරුඬ පාෂාණය මාධ්‍යය වශයෙන් භාවිතා කර ඇත.
- ග්‍රීක කලා කෘති අනුකරණය කරමින් හා අධ්‍යයනය කරමින් නිර්මාණ කර ඇත.
- ග්‍රීක ශිල්පීන්ගේ සහය ඇතිව මූර්ති නිර්මාණය කර ඇත.
- ග්‍රීක ශිල්පීන් අභිබවා යාමට රෝම ශිල්පීන් සමත් විය.

**රෝම ශිල්පීන් අතින් නිමවූ මූර්ති ලෙස,**

- ජුලියස් සීසර්, ප්‍රොම්පේ, කරකැල්ලා, පිසාරෝ (ශීර්ෂ මූර්ති)
- නොහඳුන රෝමානුවා, මාර්කස් ඔරුලියස්, ඔගස්ටස් (පූර්ණ මූර්ති)
- මාර්කස් ඔරුලියස් සුවිශේෂී මූර්තිය මෙය ලෝහ මාධ්‍යය භාවිතයෙන් ක්‍රි.ව.175 දී නිමකර ඇත.
- චලනය හා ක්‍රියාකාරීත්වය දැක්වෙන පරිදි නිමවා ඇත. අශ්වයකු පිට නැඟී අශ්වාරෝහකයෙකු නිරූපණය කරයි.
- අශ්වයාගේ පාදය ඔසවා සිටින ආකාරයේ ජංගම විලාශයක් පෙන්වයි.
- බොකුටු ඝන හිස කෙස්, මුහුණ පුරා ඝනව වැඩුණු රැවුල විසිතුරුව නෙලා ඇති කබාය ස්වභාවිකත්වය පිළිබිඹු කරයි.

**ඔගස්ටස්**

- මානව ප්‍රමාණයෙන් යුක්ත මූර්තියකි.
- අධිරාජ්‍යවරුන්ගේ චරිතයන් වස්තු විෂය කොට ගෙන ඇත.
- මෙය දැනට වතිකානු කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.
- මාධ්‍ය ලෙස කිරිගරුඬ පාෂාණය භාවිතා කර ඇත.
- රෝම හමුදාවට අධිරාජ්‍යයා විසින් අමතන අයුරු නිරූපනය කරයි.
- තෙද බල මහිමය පිළිබිඹු කරන අතර ස්වාධීනත්වය මානුෂීය හැඟීම් ප්‍රකාශනය පෙන්වයි.
- රෝම යුධ ඇඳුමින් සැරසී සිටින අතර එමගින් රෝම අනන්‍යතාව පිළිබිඹු කරයි.
- වමතින් යෂ්ටිය ද දකුණත ඉදිරියට දිගුකර සිටින අකාරයක් පෙන්වයි.
- භාව ප්‍රකාශනය අතින් ඉතා ඉහළ කුසලතාවයක් දක්වා ඇති බව පෙනේ.

**ජුලියස් සීසර්**

- මෙය රෝම ශිල්පියා විසින් කරන ලද ශීර්ෂ මූර්තියක් ලෙස පෙන්වා දිය හැක.
- මෙම මූර්තියේ අධිරාජ්‍යයාගේ චරිතය නිරූපණයට ගත් උත්සාහය පෙන්වයි.
- මුහුණේ මාංශ පේශී විස්තරාත්මකව දක්වා ඇත.
- රෝම ශිර්ෂ මූර්ති අතුරින් අගනා නිර්මාණයකි.
- කැරකැල්ලා (CARACALLA)
- මෙය රෝම කලාවේ අභිමානය කියාපායි.
- කිරිගරුඬ මාධ්‍යයෙන් නිර්මාණය කර ඇත.
- හැඟීම් ප්‍රකාශනය අතින් උසස් මූර්තියකි.
- යමක් ගැන සැක සහිත බැල්මක් හෙලන ආකාරයක් පෙන්වයි.
- තීක්ෂණ බැල්ම, කල්පනාකාරී බව ඉරියව් තුළින් පෙන්වයි. බොකුටු හිසකේ ඇහි බැම් හකුලා සිටින අයුරු අනුව බලන විට කැරකැල්ලා / කැරකාලා මූර්තිය පෘථුල පුද්ගල ස්වභාවයක් පිළිබිඹු කරයි.